# 2.45 ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල ස්වයංක්‍රීයකරණය කර ඇති ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයක් (Alice for Windows, Libsys, Libsuit, Purna, ISURU මෘදුකාංග ඇසුරෙනි)

ආර්. එම්. නදීකා සංජීවනී
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

පුස්තකාලයක මුඛ්‍ය පරමාර්ථය වන්නේ අවශ්‍ය පාඨකයාටඋ අවශ්‍ය තොරතුරු, අවශ්‍ය අවස්ථාවේදී ලබා දීමය. මෙම පරමාර්ථය වඩා සාර්ථකව සඵල කර ගැනීම සඳහා අත්හුරු ක්‍රම ශිල්පවලින් ඔබ්බට ගොස් පරිගණක තාක්ෂණය පුස්තකාල කටයුතු සඳහා යොදා ගැනේ. මෙම ක්‍රියාවලිය පුස්තකාල ස්වයංක්‍රීයකරණය ලෙස හැඳින්වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලවල ස්වයංක්‍රීයකරණය කර ඇති ක්ෂේත්‍ර පිළිබඳ මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

විශ්වවිද්‍යාල පුස්තකාලවල ස්වයංක්‍රීයකරණය වී ඇති ක්ෂේත්‍ර හඳුනා ගැනීම, ස්වයංක්‍රීයකරණයේදී ඇතිවන ගැටලු හඳුනා ගැනීම සහ එම ගැටලු සඳහා වන විසඳුම් සොයා බැලීම මෙම අධ්‍යයනයේ පරමාර්ථයන්ය. කැලණිය විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය යන පුස්තකාලවල පිළිවෙලින් භාවිතා වන ලිබ්සුයිට්, ලිබ්සිස්, ඉසුරු, ඇලිස් ෆෝ වින්ඩෝස්, පූර්ණ මෘදුකාංග නියැදිය වශයෙන් තෝරාගන්නා ලදී සාමාජික පුස්තකාලවලට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීමෙන් ලද පිළිතුරුවලට අනුව දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී.

මේ අනුව සුචිකරණ ක්ෂේත්‍රය සෑම පුස්තකාලයකම සියයට සියයක ප්‍රතිශතයකින් (100%) ස්වයංක්‍රීයකරණය කර ඇති බව අනාවරණය විය. සමස්ත නියැදියෙන් 60% ප්‍රතිශතයක් ප්‍රතිග්‍රහණ ක්ෂේත්‍රය ද, 60% ප්‍රතිශතයක් වාර සඟරා ක්ෂේත්‍රය සහ 60% ප්‍රතිශතයක් සංසරණ ක්ෂේත්‍රය ද ස්වයංක්‍රියකරණය කර ඇත.

විවිධ පුස්තකාල කාර්යයන් ස්වයංක්‍රීයකරණයට ලක් කිරීමේදී මෘදුකාංගවල අධික මිල, මොඩියුල වෙන් වෙන්ව මිලදී ගැනීමට සිදුවීම, පුහුණු ශ්‍රමිකයන් හිඟවීම, මව් ආයතනයෙන් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවීම, විවිධ සේවක ආකල්ප ආදී ගැටලු කිහිපයක් මෙම අධ්‍යයනය මඟින් හඳුනා ගැනිණි. මෙම ගැටලු සඳහා විසඳුම් වශයෙන් ස්වයංක්‍රීයකරණය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කිරීම, සේවක ආකල්ප ධනාත්මකව සැකසීම, සේවකයින් පුහුණු කිරීම, නිදහස් මෘදුකාංග සංවර්ධනය වැනි යෝජනා ඉදිරිපත් කළ හැකිය.

**මූලික පද :** පුස්තකාල ස්වයංක්‍රීයකරණය, ස්වයංක්‍රීයකරණ ක්ෂේත්‍ර පුස්තකාල මෘදුකාංග